ලිංගික අපරාධ සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී, "දූෂණය" වැනි යෙදුම් වෙනුවට, අවස්ථාවට අනුව ලිංගික අපරාධය හෝ ලිංගික අපයෝජනය යන යෙදුම් වඩාත් යෝග්‍ය යැයි අපි යෝජනා කරන්නේ, "දූෂණය" වැනි යෙදුමකින්, ලිංගික අපරාධයකට ලක් වූ අයෙකු කිළිටි වී, අපවිත්‍ර වී ඇති බවට අදහසක් ගම්‍ය වන බැවිනි.

ලිංගික අපරාධයන්ට ලක් වූවන් සම්බන්ධයෙන්, සමාජය තුළ ගර්හාත්මක, කොන් කිරීමේ ආකල්පය තවමත් ඇති බව අපට පිළිගැනීමට සිදුවේ. එවිට "දූෂණය" වැනි යෙදුම් හේතුවෙන්, එම සෘණාත්මක ආකල්පය තවත් තීව්‍ර නොවන්නේදැයි පාඨක අප ඇසිය යුතු වේ.

නිදසුනක් ලෙසට වයස අවුරුදු 16ක දැරියකට මුහුණ පෑමට සිදු වූ ලිංගික අපරාධයක් සම්බන්ධයෙන් දැක්වෙන මෙම දිනමිණ පුවත සලකා බලමු.

මෙම පුවතේ සිරස්තලයේත්, පුවත් අන්තර්ගතයේත් "දූෂණය" යන යෙදුම නැවත නැවත භාවිතා වනු දක්නට ලැබේ.

මෙම පුවතට "දූෂණය" යන යෙදුම වෙනුවට, ලිංගික අපරාධය හෝ ලිංගික අපයෝජනය යන යෙදුම් නොගැළපෙන්නේ ද? ඔබේ අදහස?

